බස්නාහිර පළාත
மேல் மாகாணம்
**Western Province**

පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත

மாகாண வீதி, போக்குவரத்து, கூட்டுறவு அபிவிருத்தி மற்றும் வாணிபம்,வீடுமற்றும் நிர்மாணத்துறை, தோட்ட உட்கட்டமைப்பு வசதிகள், கைத்தோழில் மற்றும் கிராமிய அபிவிருத்தி தொடர்பான அமைச்சு - மேல் மாகாணம்

**Ministry of Provincial Roads, Transport, Co-operative Development and Trade, Housing and Constructions, Estate Infrastructure Facilities, Industry and Rural Development - Western Province**

ලේකම් 011 2092739
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

செயலாளர் 011 2092739
எண். 204,
டென்சில் கொப்பேகடுவ மாவத்தை
பத்தரமுல்ல.

Secretary 011 2092739
No. 204,
Denzil Kobbekaduwa Mawatha,
Battaramulla

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } WP/MPR/ADM/8/4 (1 වෙළුම) | ඔබේ අංකය / உமது இல. / your No. } ........ | දිනය / திகதி / Date } 2024.06. 07 |

අධ්‍යක්ෂ,කර්මාන්ත දෙපාර්තමේන්තුව (බ.ප)
කොමසාරිස්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප)
කොමසාරිස්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (බ.ප)
කොමසාරිස්, නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව (බ.ප)
අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන දෙපාර්තමෙන්තුව (බ.ප)
පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්, පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (බ.ප)
ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප)

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිළධාරී සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිළධාරී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය-2023.</u>**

උක්ත ශීර්ෂය යටතේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක WPC/PSC/REC/03/6ᴶ හා 2024.06.06 දිනැති ලිපිය හා බැඳේ. (පිටපත් අමුණා ඇත.)

02. ඒ අනුව උක්ත ලිපිය මඟින් ඉදිරිපත් කර ඇති තොරතුරු සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කර, අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03. තවද උක්ත තනතුර සඳහා අයදුම්කරුවන් වේ නම් එම අයදුම්පත් 2024.06.30 දින හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ හැකි වන පරිදි 2024.06.24 දින හෝ ඊට ප්‍රථම අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.ඒ. ඉරේෂා ශ්‍යාමලි
පරිපාලන නිලධාරී
ලේකම් වෙනුවට
පළාත් මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප)

දුරකතන අංකය:- 0112-092749
ෆැක්ස් අංකය :- 0112-092746
විද්‍යුත් තැපැල :- mproadswp@gmail.com

පිටපත:
1. අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිළධාරීන් - කරු.අ.ක.ස
2. අමාත්‍යාංශයේ සියළුම නිළධාරීන් - කරු.අ.ක.ස

කාර්යාලය/காரியாலயம்/ Office : පාලන අංශය 011 2092737
ගිණුම් අංශය 011 2092742
සැළසුම් අංශය 011 2092756
ෆැක්ස් / பெக்ஸ் இல. / Fax :/ 011-2092746
ඊමේල්/இ-தபால் / E-mail mproadswp@gmail.com

**විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්**

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
# PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය.இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. — WPC/PSC/REC/03/6-i | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date — 2024.06. 06 |

RECEIVED 07 JUN 2024

ප්‍රධාන ලේකම්, (බ.ප.)
ආණ්ඩුකාර ලේකම්, (බ.ප.)
සභා ලේකම්, (බ.ප.)
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, (බ.ප.)

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය – 2023**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත මේ සමඟ අමුණා ඔබ වෙත යොමු කරමි. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024.06.30 වේ. එදිනට සුදුසුකම්ලත් නිලධාරීන් සම්පූර්ණ කරන ලද අයදුම්පත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. මෙම අයදුම්පත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මගින් බාගත කර ගත හැක.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය – 2023

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් පරිමාණය

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.පරි.ච.03/2016 අනුව රු. 31,490 -10×445-11 ×660-10×730-5×750-54,250/- වේ. වැටුප් කේත අංකය MN-4-2016 වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

03. සේවා කොන්දේසි

අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

04. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්

ග්‍රාම සංවර්ධන නිලධාරී තනතුරේ පුරප්පාඩු 10 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරන අතර මේ සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**4.1** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2024.06.30** දින වේ. අයදුම් කරන තනතුරට අදාල සියලු සුදුසුකම් **2024.06.30.** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. සුදුසුකම්

**5.1.** අධ්‍යාපන සුදුසුකම්

5.1.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති නිලධාරියකු වීම

හෝ

5.1.2 ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතිකය හෝ ග්‍රාම සංවර්ධනය පිළිබඳ සහතිකය හෝ කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය හෝ ලබා තිබීම

සහ

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරියකු වීම

හෝ

5.1.3 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති රා.ප.ච. MN- 01 06/2006A වැටුප් පරිමාණයට සමාන හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති හා අවසන් පූර්වාසන්න වසර 05 තුල සියලුම වැටුප් වර්ධක උපයා ගෙන ඇති නිලධාරියකු වීම

**5.2.** කායික සුදුසුකම්

සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**5.3.** වෙනත්

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත ඉහත සඳහන් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06. වයස් සීමාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු වූවන් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

07. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්ණ පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2.බස්නාහිර පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | පැය 02 | 100 | 40% |

08. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහය | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VII, VIII,XII, XIII,XIV, XVI, XXV, XXX පරිච්ඡේද |
| 2. බස්නාහිර පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | බස්නාහිර පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ III, V, VI, VII, X පරිච්ඡේද |

09. විභාග ගාස්තු

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.1,200/- කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා බ.ප. 01 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

10. අයදුම්කිරීමේ ක්‍රමය

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරිවිය යුතුය. අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2021.06.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2023"** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඇ) අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් යොමු කරනු ඇත. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවිය මඟින් ප්‍රවේශ පත්‍ර භාගත කර ගැනීමේ හැකියාව පවතී. එසේම ප්‍රවේශපත්‍රය නිල වෙබ් අඩවිය මඟින් භාගත කර ගැනීමට නොහැකි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

11. **විභාගයට ඇතුල්වීම:**

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

12. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) වලංගු ජාතික හැඳුනුම්පත
ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

14. විභාග ක්‍රමය:

i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

15. බඳවා ගැනීමේ ක්‍රමය

සුදුසුකම් ලැබීම සඳහා ලිඛිත විභාගයට පෙනී සිට අවම වශයෙන් එක් එක් ප්‍රශ්ණ පත්‍රයට ලකුණු 40%ක් බැගින් ලබා ගත යුතුය. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර තනතුරට බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීමට පමණක් මෙය පවත්වනු ලැබේ.

16. මෙම විභාග වලින් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2024.06. ୨୧

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2023 (සීමිත)

විභාග අංකය ☐
(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E
☐

01 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..........................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
..........................................................
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-..........................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02 2.1 දැනට දරණ තනතුර : ..........................................................
2.2 එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න : ..........................................................
2.3 එම තනතුරට පත්වීමේ දිනය : ..........................................................
2.4 සේවය ස්ථිර කල දිනය : ..........................................................
2.5 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය : ..........................................................
2.6 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ..........................................................
..........................................................

03 3.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................................
..........................................................

3.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්): ..........................................................
..........................................................

3.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:
i. සිංහලෙන්/දෙමළෙන්- ..........................................................
..........................................................
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්- ..........................................................
..........................................................

3.4 දුරකථන අංකය :

ස්ථාවර: ☐☐☐☐☐☐☐☐☐☐ ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

04 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

05 5.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

5.2 උපන් දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

5.3 වයස අවුරුදු : ☐☐ මාස: ☐☐ දින: ☐☐

06 අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

6.1 අයදුම්පත් ඉදිරිපත් කරන්නේ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 5.1.1, 5.1.2, 5.1.3 අනුව ද යන්න සඳහන් කරන්න. ඒ අනුව අදාළ පරිදි පහත විස්තර දක්වන්න.

6.1.1 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 5.1.1 අනුව නම් උපාධිය පිළිබඳ විස්තර :

I. ලබා ඇති උපාධිය :

II. විශ්ව විද්‍යාලයේ නම :

III. උපාධි සහතිකය වලංගු දිනය :

6.1.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 5.1.2 අනුව නම් අදාළ තොරතුරු :

I. ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය වලංගු වන දිනය :

II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතිකය හෝ ග්‍රාම සංවර්ධනය පිළිබඳ සහතිකය වලංගු දිනය :

III. කෘෂි අභ්‍යාස විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය වලංගු දිනය :

IV. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල දිනය :

6.1.3 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 5.1.3 අනුව නම් අදාළ තොරතුරු :

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවයේ ස්ථිර කර ඇති රා.ප.ව.MN-01, 03/2016A වැටුප් පරිමාණයට සමාන හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයකට අනුව දරන ලද තනතුරේ,

i. මුල් පත්වීම් දිනය :

ii. වසර 10 සක්‍රිය හා සතුටුදායක සේවය සපුරන දිනය :

07 අයදුම්පත් කැඳවීමේ අවසන් දවස වන 2024.60.30 දිනට අදාළ තනතුරේ ඔබ ,

i. පූර්වාසන්න වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..........

ii. වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ..........

iii. වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? ..........

iv. ඔබට විරුද්ධව පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර තිබේද?
..........

v. ඉහත iv සඳහා පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න..........
..........

08 ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..........

විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය - ..........

දිනය - ..........

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න |
|---|

09 අයදුම්කරුගේ සහතිකය

........................................................................................................................................
........................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය ..............................

..................................................
අයදුම්කරුගේ අත්සන

10 ආයතන ප්‍රධානියාගේ සහතිකය
( අනවශ්‍ය වචන කපා හරින්න)

........................................................ මහතා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ............................ දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................ ........................තනතුරක සේවය කරන බවත් එම තනතුරේ .......................... දිනට වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නොමැති බවත්, පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නොමැති බවත්, වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති/ඇති බවත් සහතික කරමි. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර අදාල බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම නිලධාරියා/ නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය ..............................

..................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2015.10.22 දින අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................................ තනතුරට බඳවා ගැනීමේ පටිපාටියේ 7.3.2 වගන්තිය අනුව ............................................ මහතා/මිය/මෙනවිය සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ..............................

..................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

12. ප්‍රධාන ලේකම් (බ.ප) / අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය

ඉහත අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ..............................

..................................................................
ප්‍රධාන ලේකම්(බ.ප)/අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ
අත්සන හා නිල මුද්‍රාව